# කාර්ය සාධන වාර්තාව

## 2025 - සිව්වන කාර්තුව

2025

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

# දැක්ම

සුපිලිපන්නබව දිරි ගැන්වෙන සහ යුක්තිය තහවුරු කෙරෙන දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක්

# මෙහෙවර

නීතිය සවිමත් ව බලාත්මක කිරීම, නිවාරණ යාන්ත්‍රණයන් හා විනිවිදබව සහිත පාලනයක් තුලින් දූෂණය තුරන් කිරීම සහ එමගින් සවිමත් ආර්ථිකයක් ඇති කිරීමට සහය වීම මෙන් ම සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා දේශයේ සම්පත් සුරැකීම


| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | 01 |
| පැමිණිලි යොමුවීම | 04 |
| විමර්ශන, වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම් | 06 |
| නඩු පැවරීම | 07 |
| නිවාරණය | 11 |
| මානව හා භෞතික සම්පත් කළමනාකරණය | 13 |

## 01. හැඳින්වීම

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ විධි විධාන අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවනු ලැබ ඇති අතර, පනතේ 3(2) උප වගන්තිය අනුව මෙය අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වන බව දක්වා ඇත. එමෙන්ම කොමිෂන් සභාවට පනත මගින් පැවරී ඇති බලතල හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී නීතිය යටතේ හිමිකම් ලැබූ අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් මගින් හැර වෙනත් කිසිදු මැදිහත්වීමකට යටත් නොවී ස්වාධීනව කටයුතු සිදුකළ යුතු බව 3(4) උප වගන්තිය මගින් දක්වා ඇත.

### 1.1 කොමිෂන් සභාවේ සංයුතිය

#### 1.1.1 කොමිෂන් සභාවේ සාමාජිකයින්

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 4(1) උප වගන්තිය අනුව, නීතිය පිළිබඳ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්දක් සහිත ප්‍රවීණ හා විශිෂ්ඨත්වයට පත්වූ එක් තැනැත්තෙකු හා

I. අපරාධ විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම
II. ව්‍යෝහාරික විගණනය
III. ව්‍යෝහාරික ගිණුම්කරණය
IV. ඉංජිනේරු විද්‍යාව
V. ජාත්‍යන්තර සම්බන්ධතා සහ රාජ්‍ය තාන්ත්‍රික සේවා
VI. මහජන කටයුතු කළමනාකරණය
VII. රාජ්‍ය පරිපාලනය

යන සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු 20 ක පළපුරුද්දක් සහිත තැනැත්තන් දෙදෙනෙකු ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ.

ඒ අනුව,

- හිටපු අභියාචනාධිකරණ විනිසුරු හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය මහලේකම් විනිසුරු ඩබ්.එම්.එන්.පී. ඉද්දවල මහතා - සභාපති
- ජ්‍යෝෂ්ඨ බැංකු කරුවෙකු වන මහජන බැංකුවේ හිටපු ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කේ.බර්නාඩ් රාජපක්ෂ මහතා - සාමාජික
- හිටපු අතිරේක සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ චෛතිය ගුණසේකර මහතා - සාමාජික

යන සාමාජිකයින් තිදෙනා 2024 ජනවාරි මස 01 වන දින සිට කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරනු ලැබේ.

### 1.1.2 අධ්‍යක්ෂ ජනරාල්


2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 17(1) වගන්තිය අනුව පත්කළ මහාධිකරණ විනිසුරු රංග ශ්‍රීනාත් අබේවික්‍රම දිසානායක මහතා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් 2025 ජනවාරි මස 10 වන දින සිට රාජකාරි සිදුකරනු ලැබේ.

## 1.2 කොමිෂන් සභාවේ කාර්යභාරය

1. 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් ලැබෙන ලැම්ණිලි සඳහා සාධාරණ විමර්ශන සිදුකිරීම, ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වන පැමිණිලි සඳහා නියමිත අධිකරණයන්හි නඩු පැවරීම සහ අධිකරණ වල එම නඩු මෙහෙයවීම.
2. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ මධ්‍යම අධිකාරිය වශයෙන් ක්‍රියා කිරීම.
3. දූෂණය වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා විසින් එළඹ ඇති ජාත්‍යන්තර සම්මුති, ගිවිසුම් සහ බැඳීම් ක්‍රියාත්මක කිරීම.
4. දූෂිත ක්‍රියා පිළිබඳව මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම.
5. දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
6. දූෂණ ක්‍රියා අනාවරණය කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල නීති, පරිචයන් සහ කාර්ය පටිපාටි පරීක්ෂා කිරීම.
7. දූෂණය තුරන් කිරීම සඳහා රාජ්‍ය හෝ පුද්ගලික ආයතන වෙත මගපෙන්වීම සහ නියෝග ලබාදීම.
8. දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීම.
9. කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවා නියුක්තයන්ගේ පත්වීම්, උසස් වීම් සහ විනය පාලනය සම්බන්ධ කටයුතු

## 1.3 කොමිෂන් සභාවේ ව්‍යුහය

වර්තමානය වන විට කොමිෂන් සභාවේ කටයුතු සිදුවන සංවිධාන ව්‍යුහය පහත පරිදි වන අතර, දූෂණ විරෝධී පනත මඟින් පෙර පැවැති පනත් වලට අමතරව පැවරුණු රාජකාරි හා වගකීම් ඉටුකිරීමට අදාලව කොමිෂන් සභාව ප්‍රතිසංවිධානය සිදුකරනු ලබන අතර, එම කටයුතු වලින් අනතුරුව කොමිෂන් සභාවේ ව්‍යුහය සංශෝධනය වීමට නියමිතය.



## 02. පැමිණිලි යොමුවීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත, අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් වන පැමිණිලි පහත ක්‍රම මඟින් යොමු කිරීමට හැකියාව ඇත.

- 1954 දුරකතන අංකයට ඇමතීම මඟින්
- Fax පණිවිඩ මඟින්
- විද්‍යුත් තැපැල මඟින්
- අතින් ගෙනැවිත් භාරදීමෙන්
- කාර්යාලීය ලිපිනයට නාමිකව හෝ නිර්නාමිකව යොමුකරන ලිපි මඟින්


2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත සම්මත වීමෙන් පසු ජනතාව අල්ලස් හා දූෂණ මර්ධනය සම්බන්ධයෙන් දක්වන උනන්දුව වැඩිවීම හා දූෂණ නිවාරණ ඒකකය මගින් රටපුරා පවත්වනු ලබන වැඩසටහන් තුළින් ප්‍රජාවගේ දැනුවත්භාවය ඉහළ යාම හේතුවෙන්, අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් පෙර වර්ෂ වලදී ලද පැමිණිලි වලට සාපේක්ෂව 2025 වර්ෂයේ සිව්වන කාර්තුව දක්වා ලද පැමිණිලි වල වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමුවන පැමිණිලි, කොමිෂන් සභාවේ ලේකම් අංශය මගින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව වෙත යොමුකරනු ලබන අතර, එහිදී අල්ලස් පනතට අදාල නොවන හා ප්‍රමාණවත් කරුණු අනාවරණය නොවන පැමිණිලි විමර්ශනය සඳහා භාජනය නොකිරීමට කොමිෂන් සභාව තීරණය කරනු ලබයි. 2015 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ලද පැමිණිලි හා ඉන් විමර්ශනයට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාවන් පහත පරිදි වේ.

ලද පැමිණිලි හා විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි 2015 - 2025

| වර්ෂය | ලද පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාව ** |
|---|---|---|
| 2015 | 3,964 | 1,823 |
| 2016 | 3,450 | 2,435 |
| 2017 | 2,768 | 1,573 |
| 2018 | 3,465 | 2,086 |
| 2019 | 3,305 | 2,020 |
| 2020 | 2,764 | 1,909 |
| 2021 | 2,335 | 892 |
| 2022 | 2,512 | 921 |
| 2023 | 3,431 | 1,152 |
| 2024 | 4,267 | 1,105 |
| 2025 | 8,409 | 569 |

** වැටලීම් සඳහා ලද පැමිණිලි හැර




විමර්ශනය කිරීමට නියෝග කරනු ලබන පැමිණිලි කොමිෂන් සභාවේ විමර්ශන අංශයට යොමුකරනු ලබන අතර, වෙනත් ආයතන වලින් වාර්තා කැඳවීමට හා විමර්ශන ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳව සලකා බැලීමට නීති වාර්තා කැඳවීම අවශ්‍ය වන පැමිණිලි සම්බන්ධව අදාළ කටයුතු කොමිෂන් සභාවේ ලේකම් අංශය මගින් සිදුකරනු ලැබේ.

**කොමිෂන් සභාව සමග සම්බන්ද විය හැකි ආකාරය**

**ක්ෂණික ඇමතුම්** : 1954

**විද්‍යුත් ලිපිනය** : ciaboc_gen@ciaboc.gov.lk

**ෆැක්ස්** : 0112596360

**ලිපිනය** : 36, මලලසේකර මාවත, කොළඹ 07

**කොමිෂන් සභාව වෙත පුද්ගලිකව පැමිණීමෙන්ද, පැමිණිලි කළ හැක**

## 03. විමර්ශන, වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ දක්වා ඇති වැරදි සම්බන්ධ විමර්ශන කටයුතු කොමිෂන් සභාවේ විමර්ශන අංශය මගින් සිදුකරනු ලැබේ. පනතේ 42 වගන්තිය ප්‍රකාරව,

- යම් තොරතුරක් ලැබීමෙන් පසුව
- පැමිණිල්ලක් ලැබීමෙන් පසුව
- කොමිෂන් සභාවේ අවශ්‍යතාවය අනුව හෝ
- කොමිෂන් සභාව වෙත ලැබෙන වෙනත් යම් වැදගත් දෙයක් මත පදනම්ව

මූලික පරීක්ෂණයක් ආරම්භ කළ හැකි වේ. එහිදී පනතේ 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, විමර්ශනයක් පැවැත්වීමට තීරණය කළ හැක. එසේ වුවද, 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම් මූලික පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව විමර්ශනයක් පැවැත්වීමට ද කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

### 3.1 විමර්ශන කටයුතු

කොමිෂන් සභාව විසින් 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා ලැබුණු පැමිණිලි අතුරින් විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි 569 කට අදාළ ගොනු වල විමර්ශන කටයුතු විමර්ශන අංශය මගින් ආරම්භ කර සිදුකළ අතර, මීට පෙර කාලසීමාවන්හි ලැබුණු ගොනු ද ඇතුළුව 2025.12.31 දින වන විට විමර්ශන ගොනු 2,559 කට අදාළ විමර්ශන කටයුතු සිදුකරමින් පවතී.

### 3.2 වැටලීම්

අල්ලස් ලබාගැනීමේ හෝ ලබාදීමේ සිදුවීම් සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු සහ පැමිණිලිකරුගේ සහයෝගය ලැබෙන අවස්ථාවන්හිදී කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අදාල වරද සිදුවන අවස්ථාවේදී වැටලීමක් සිදුකර අත්අඩංගුවට ගැනීම් සිදුකෙරේ. 2025 වර්ෂයේ සිව්වන කාර්තුව තුළ එවැනි වැටලීම් 130ක් සිදුකරන ලද අතර, ඉන් 68ක් ඵලදායි විය. වැටලීම් වලදී සැකකරුවන් 84 දෙනෙකු අත්අඩංගුවට ගැනීමට හැකි විය.

### 3.3 අත්අඩංගුවට ගැනීම්

#### 3.3.1 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සිදුකරන ලද වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්


| වර්ෂය | සිදුකරන ලද ඵලදායි වැටලීම් සංඛ්‍යාව | වැටලීම් වලදී අත්අඩංගුවට ගත් සංඛ්‍යාව |
|---|---|---|
| **2020** | 38 | 45 |
| **2021** | 33 | 36 |
| **2022** | 32 | 36 |
| **2023** | 43 | 57 |
| **2024** | 53 | 86 |
| **2025** | 68 | 84 |

## 04. නඩු පැවරීම්

විමර්ශන කටයුතු නිමකර නඩු පැවරීමට කරුණු පවතින ගොනු වලට අදාලව නඩු පැවරීමේ කාර්යය ඉටුකරනු ලබන්නේ කොමිෂන් සභාවේ නීති අංශය මගිනි. ඒ අනුව 2025 වර්ෂය තුළ නඩු 115 ක් පවරා ඇති අතර අදාල කාලය තුල අවසන් වී ඇති නඩු සංඛ්‍යාව 69 කි.


### 4.1 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා පවරන ලද නඩු පිළිබඳ තොරතුරු

| වර්ෂය | අල්ලස් නඩු | දූෂණ නඩු | අයුතු වත්කම් ඉපයීම් පිළිබඳ නඩු | වත්කම් බැරකම් හෙළි නොකිරීම් පිළිබඳ නඩු | මුදල් විශුද්ධිකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2020 | 47 | 1 | 2 | -- | -- | 50 |
| 2021 | 58 | 2 | -- | 2 | -- | 62 |
| 2022 | 62 | 26 | -- | 1 | -- | 89 |
| 2023 | 55 | 3 | 2 | -- | -- | 60 |
| 2024 | 70 | 10 | 3 | -- | -- | 83 |
| 2025 | 75 | 21 | 14 | -- | 05 | 115 |



## 4.2 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා අවසන් වූ නඩු පිළිබඳ තොරතුරු

| වර්ෂය | අල්ලස් නඩු | දූෂණ නඩු | අයුතු වත්කම් ඉපයීම් පිළිබඳ නඩු | වත්කම් බැරකම් හෙළි නොකිරීම් පිළිබඳ නඩු | එකතුව |
|---|---|---|---|---|---|
| 2020 | 52 | | 03 | -- | 55 |
| 2021 | 62 | | 05 | 02 | 69 |
| 2022 | 90 | | -- | 07 | 97 |
| 2023 | 58 | 10 | 01 | -- | 69 |
| 2024 | 62 | 07 | -- | -- | 69 |
| 2025 | 62 | 06 | 01 | -- | 69 |



## 4.3 2015 වර්ෂයේ සිට 2025 සිව්වන කාර්තුව දක්වා පවරණ ලද නඩු සංඛ්‍යාව, අවසන් කරන ලද නඩු සංඛ්‍යාව සහ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව

| වර්ෂය | පවරන ලද නඩු | | | අවසන් කරන ලද නඩු | | | | විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | මහාධිකරණය | මහේස්ත්‍රාත් අධිකරණය | එකතුව | මහාධිකරණය | මහේස්ත්‍රාත් අධිකරණය | ත්‍රිපුද්ගල මහාධිකරණ | එකතුව | |
| 2015 | 76 | 32 | 108 | 41 | 11 | - | 52 | 15 |
| 2016 | 43 | 44 | 87 | 26 | 08 | - | 34 | 15 |
| 2017 | 41 | 32 | 73 | 68 | 20 | - | 88 | 57 |
| 2018 | 36 | 16 | 52 | 84 | 26 | - | 110 | 64 |
| 2019 | 37 | 09 | 46 | 75 | 19 | - | 94 | 54 |
| 2020 | 42 | 08 | 50 | 46 | 09 | - | 55 | 28 |
| 2021 | 57 | 05 | 62 | 43 | 26 | - | 69 | 09 |
| 2022 | 77 | 12 | 89 | 65 | 32 | - | 97 | 22 |
| 2023 | 56 | 04 | 60 | 60 | 09 | - | 69 | 19 |
| 2024 | 79 | 04 | 83 | 56 | 13 | - | 69 | 30 |
| 2025 | 115 | -- | 115 | 58 | 10 | 01 | 69 | 42 |

## 4.4 2025.01.01 – 2025.12.31 දින දක්වා නඩු තීන්දු මගින් විත්තිකරුවන් වරදකරුවන් බවට පත්වූ අය පිළිබඳ විස්තර

| අනු අංකය | ආයතනය | වරදකරුවන් වූ නිලධාරියාගේ තනතුර | වරදකරුවන් වූ සංඛ්‍යාව | වරදකරුවන් වූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | සනීපාරක්ෂක කම්කරු - කුලියාපිටිය රජයේ රෝහල | 01 | 01 |
| 02. | සෞඛ්‍ය අමාත්‍යාංශය | පශු වෛද්‍ය නිලධාරී | 01 | 01 |
| 03. | පොලිස් දෙපාර්තමේන්තුව | සහකාර පොලිස් අධිකාරී | 01 | 06 |
| | | පොලිස් කොස්තාපල් | 04 | |
| | | උප පොලිස් පරීක්ෂක | 01 | |
| 04. | අධ්‍යාපන අමාත්‍යාංශය | විදුහල්පති | 01 | 01 |
| 05. | | සිවිල් පුද්ගලයන් | 11 | 10 |
| 05. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කාර්මික නිලධාරී | 01 | 04 |
| | | ආර්ථික සංවර්ධන නිලධාරී | 01 | |
| | | සහකාර සැලසුම් අධ්‍යක්ෂ | 01 | |
| | | රියදුරු | 01 | |
| 06. | තැපැල් දෙපාර්තමේන්තුව | කාර්යාල කාර්ය සහායක | 01 | 01 |
| 07. | ආගමන විගමන දෙපාර්ත. | කළමනාකරණ සහකාර | 01 | 01 |
| 08. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | කාර්යාල කාර්ය සහායක | 01 | 01 |
| 09. | උතුරු මැද පළාත් සභාව | ප්‍රධාන අමාත්‍ය | 01 | 01 |
| | | පුද්ගලික ලේකම් | 01 | |

| | | | | |
|---|---|---|---|---|
| 10. | දිවි නැගුම | සංවර්ධන නිලධාරී | 01 | 01 |
| 11. | සුරාබදු දෙපාර්තමේන්තුව | සුරාබදු නියාමක | 02 | 01 |
| 12. | ලංකා ස.තො.ස. ආයතනය | හිටපු ස.තො.ස. සභාපති (හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී) | 01 | 01 |
| | ක්‍රීඩා අමාත්‍යාංශය | හිටපු ක්‍රීඩා අමාත්‍ය | 01 | |
| 13. | මහේස්ත්‍රාත් අධිකරණය | රෙජිස්ට්‍රාර් | 01 | 01 |
| 14. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | ඉඩම් නිලධාරී | 01 | 01 |
| 15. | ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය | කම්බි මාර්ගකරු | 01 | 01 |
| 16. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | 01 | 01 |
| | | ගොවිජන සංවර්ධන නිලධාරී | 01 | |
| 17. | මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය | කළමනාකරු | 01 | 01 |
| | | ආරක්ෂක සාමාන්‍යාධිකාරී | 01 | |
| 18. | වනජීවී කාර්යාලය | බීට්ටු වන නිලධාරී | 01 | 01 |
| **එකතුව** | | | **42** | **36** |

## 4.5 විභාග වෙමින් පවතින නඩු

**2025 දෙසැම්බර් මස 31 දින වනවිට අධිකරණවල නඩු 305 ක් විභාග වෙමින් පවතී. ඒ පහත පරිදිය.**

මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 16
මහාධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 288
ත්‍රිපුද්ගල මහාධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 01

## 05. නිවාරණය

අල්ලස හා දූෂණයෙහි අනිසි ප්‍රතිවිපාකයන් සහ අල්ලස හා දූෂණයට එරෙහිවීම මෙන්ම වැළැක්වීමේ ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, අධ්‍යාපන ක්ෂේත්‍රය හා මහජනතාව ඉලක්ක කරගනිමින් දීප ව්‍යාප්තව දූෂණ නිවාරණ වැඩ සටහන් පැවැත්වීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත

### 5.1 2025.01.01 - 2025.12.31 දක්වා පවත්වන ලද දූෂණ නිවාරණ වැඩ සටහන් පිළිබඳ සාරාංශගත තොරතුරු

| වැඩ සටහන් පැවැත්වූ ආයතනය | සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා | 115 |
| අර්ධ රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා | 67 |
| පුද්ගලික ආයතන වල නිලධාරීන් සඳහා | 25 |
| වෙනත් පාර්ශවයන්/ පුද්ගලයන් සඳහා | 1 |
| ජනමාධ්‍ය මගින් පවත්වන ලද වැඩ සටහන් | 2 |
| **මුළු වැඩසටහන් සංඛ්‍යාව** | 210 |

### 5.2 අභ්‍යන්තර කටයුතු ඒකක වලට අදාළව පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර

2025 පෙබරවාරි 18 දිනැති PS/SB/Circular/2/2025 චක්‍රලේඛය අනුව 'සියලුම රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීම' යන මැයෙන් ජනාධිපති ලේකම්වරයා විසින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීමට සහ නම් කරන ලද රජයේ ආයතන සඳහා කේන්ද්‍රස්ථාන නම් කිරීමට උපදෙස් නිකුත් කර ඇත. මෙම අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීමේ අරමුණු ,

1. ආයතන තුළ දූෂණය වැළැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම
2. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම්වල විනිවිදබාවය සහ වගවීම සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහතික කිරීම
3. ආයතන තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම
4. විෂමාචාර වාර්තා කිරීම දිරිගැන්වීම, තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම
5. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් නීති බලාත්මක කිරීමට සහාය වීම

යනා දී ලෙස දැක්විය හැකිය. මෙම ප්‍රයත්නය 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත මෙන් ම දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (UNCAC) ඇතුළු විවිධ ජාත්‍යන්තර දූෂණ විරෝධී ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කරනු ඇත.

අභ්‍යන්තර කටයුතු ඒකක පිළිබඳ දැනුවත් කිරීම සඳහා වූ පළමු වැඩමුළුව 2025 පෙබරවාරි 27 වන දින පවත්වන ලද අතර ඒ සඳහා සියළුම අමාත්‍යාංශ, පළාත් සභා හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ

හඳුනාගත් දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 107ක් නියෝජනය කරමින් ආයතන ප්‍රධානීන් සහභාගී වූ අතර ඊට සමගාමීව 2025 වර්ෂය තුළ පවත්වනු ලැබූ වැඩසටහන් පිළිබඳ සාරාංශගත තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | වැඩසටහන පැවැත්වූ දිනය | වැඩසටහන සඳහා ඉලක්කගත කණ්ඩායම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 2025.05.14 | සියළුම අමාත්‍යාංශ වල ලේකම් හෝ ජ්‍යෂ්ඨ නිළධාරීන් | 56 |
| 2 | 2025.05.15 | හඳුනාගත් දෙපාර්තමේන්තු සහ ආයතනයන්හි ප්‍රධානීන් සහ ජ්‍යෂ්ඨ නිළධාරීන් | 58 |
| 3 | 2025.05.16 | හඳුනාගත් දෙපාර්තමේන්තු සහ ආයතනයන්හි ප්‍රධානීන් සහ ජ්‍යෂ්ඨ නිළධාරීන් | 54 |
| 4 | 2025.05.21 | ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති කාර්යාලය, කැබිනට් අමාත්‍යවරුන්ගේ කාර්යාලය, පාර්ලිමේන්තුව, අධිකරණ සේවා කොමිෂන් සභාව යන ආයතනයන් නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරු සහ දිස්ත්‍රික් ලේකම්වරු | 93 |
| 5 | 2025.06.12,13 | හඳුනාගත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සහ ආයතන 10ක අභ්‍යන්තර කටයුතු ඒකකයේ නිලධාරීන් ලෙස තෝරා පත්කරගන්නා ලද නිළධාරීන් | 46 |
| 6 | 2025.06.17,18 | අගමැති කාර්යාලය, ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුධා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කටයුතු ඒකකයේ නිලධාරීන් ලෙස තෝරා පත්කරගන්නා ලද නිළධාරීන් | 53 |
| 7 | 2025.07.01,02 | හඳුනාගත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 10ක අභ්‍යන්තර කටයුතු ඒකකයේ නිලධාරීන් ලෙස තෝරා පත්කරගන්නා ලද නිළධාරීන් | 55 |
| 8 | 2025.07.08,09 | හඳුනාගත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 10ක අභ්‍යන්තර කටයුතු ඒකකයේ නිලධාරීන් ලෙස තෝරා පත්කරගන්නා ලද නිළධාරීන් | 47 |
| 9 | 2025.07.15,16 | හඳුනාගත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සහ ආයතන 10ක අභ්‍යන්තර කටයුතු ඒකකයේ නිලධාරීන් ලෙස තෝරා පත්කරගන්නා ලද නිළධාරීන් | 48 |
| 10 | 2025.07.22,23 | හඳුනාගත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 10ක අභ්‍යන්තර කටයුතු ඒකකයේ නිලධාරීන් ලෙස තෝරා පත්කරගන්නා ලද නිළධාරීන් | 49 |
| 11 | 2025.07.29,30 | හඳුනාගත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 10ක අභ්‍යන්තර කටයුතු ඒකකයේ නිලධාරීන් ලෙස තෝරා පත්කරගන්නා ලද නිළධාරීන් | 48 |

## 06. මානව හා භෞතික සම්පත් කළමනාකරණය

කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටුකිරීමෙහිලා අවශ්‍ය භෞතික හා මානව සම්පත් කළමනාකරණය හා මූල්‍ය කළමනාකරණය පාලන අංශය සහ මුදල් අංශය මගින් සිදුකෙරේ. එම කටයුතු වල ප්‍රගතිය පහත පරිදි වේ.

### 6.1 මානව සම්පත් සංවර්ධනය - දේශීය පුහුණු කටයුතු (2025.10.01 – 2025.12.31 දක්වා කාල සීමාවට/ 2025 සිව්වන කාර්තුවට අදාළව)

| අනු අං. | පුහුණු වැඩමුළුව/සම්මන්ත්‍රණයේ නම | සහභාගී වූ නිලධාරීන් | | කාලසීමාව | වියදම |
|---|---|---|---|---|---|
| | | තනතුර | සංඛ්‍යාව | | |
| 01 | සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම පිළිබඳ පුහුණු වැඩසටහන | කළමනාකරණ සේවා නිලධාරී | 1 | 2025.10.22/23 | රු.13,000/- |
| 02 | භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා | සංවර්ධන නිළධාරී<br>කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.10.23/24 | රු.26,000/- |
| 03 | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය සහ වගකීම | සංවර්ධන නිළධාරී | 1 | 2025.10.30/31 | රු.13,000/- |
| 04 | workshop on preliminary investigation | සංවර්ධන නිළධාරී<br>කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.11.04 | රු.15,000/- |
| 05 | භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා | සංවර්ධන නිළධාරී<br>කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.11.26/27 | රු.26,000/- |
| 06 | workshop on advanced MS Exel | සංවර්ධන නිළධාරී(3)<br>කළමනාකරණ සේවා නිලධාරී (3) | 6 | 2025.11.24/25 | රු.84,000/- |
| 07 | ගබඩා කළමණාකරණය | කළමනාකරණ සේවා නිලධාරී | 1 | 2025.11.27/28 | රු.26,000/- |
| 08 | Workshop on Database appliations using MS Access | සංවර්ධන නිළධාරී (2)<br>කළමනාකරණ සේවා නිලධාරී (4) | 6 | 2025.12.18/19 | රු.90,000/- |
| 09 | Filling official letter writing | සංවර්ධන නිළධාරී<br>කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.12.10 | රු.15,000/- |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | Best practice in handling audit quarries | කළමනාකරණ සේවා නිලධාරී | 1 | 2025.12.15 | රු.7,500/- |
| 11 | Training on official letters and reports | කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.12.17 | රු.15,000/- |
| 12 | Ms office essentials word excel powerpoint | කළමනාකරණ සේවා නිලධාරී | 5 | 2025.12.10/11 | රු.75,000/- |
| 13 | කාර්යාල කළමණාකරනය සඳහා ඩිජිටල් තාක්ෂණය | සංවර්ධන නිළධාරී | 2 | 2025.12.18/19 | රු.26,000/- |
| 14 | ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිළිබඳ | කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.12.15/16 | රු.26,000/- |
| 15 | සටහන් ලිපි වාර්තා ලිවීම පිළිබඳ පුහුණුව | කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.12.19 | රු.14,000/- |
| 16 | වැටුප් පරිවර්තන පිළිබඳ පුහුණුව | කළමනාකරණ සේවා නිලධාරී | 5 | 2025.12.16/17 | රු. 65,000/- |
| 17 | Workshop on Empowering workplace productivity through AI | සංවර්ධන නිළධාරී (3)<br>කළමනාකරණ සේවා නිලධාරී (4) | 7 | 2025.12.10 | රු.52,500/- |
| 18 | 2024 නව මිලදීගැනීමේ මාර්ගෝපදේශ | කළමනාකරණ සේවා නිලධාරී | 2 | 2025.12.17/23 | රු.30,000/- |
| 19 | Advance MS Excel | කළමනාකරණ සේවා නිලධාරී | 4 | 2025.12.22/23 | රු.54,000/- |
| 20 | 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන | විමර්ශන නිළධාරී | 80 | 2025.12.19/20 | රු. 363,856/54 |
| 21 | ලෝක බැංකුව(STAR) තාක්ෂණික සහාය වැඩමුළුව | ලෝක බැංකු නිළධාරී<br>නීති නිළධාරී<br>විමර්ශන නිළධාරී | 90 | 2025.12.02/03/05 | රු.343,860.00 |

## 6.2 මානව සම්පත් සංවර්ධනය - විදේශීය පුහුණු පාඨමාලාවන් (2025.10.01 – 2025.12.31 දක්වා කාල සීමාවට/ 2025 සිව්වන කාර්තුවට අදාළව)

| අනු අං | පුහුණු වැඩමුළුව / සම්මන්ත්‍රණය පැවැත් වූ රට | පුහුණු වැඩමුළුව / සම්මන්ත්‍රණයේ නම | සහභාගී වූ නිලධාරීන් | කාල සීමාව | වියදම |
|---|---|---|---|---|---|
| 1 | Malaysia | Executive certificate course for strategic management of Anti-Corruption programme | Mr. MDCN Gunathilaka - Inspector of Police<br>Mr. WAMS Bandara - Police Sergeant | From 08/10/2025 to 25/10/2025 | Incidental Allowance – USD 96<br>Combined Allowance – USD 136 |
| 2 | Japan | Criminal Justice Response to corruption | Miss. W.M.T.D. Bandara - Assi. Director General<br>Mrs. J.P.T.N. Jayaneththi - Asst. Director (Legal)<br>Mr. S.M. Sabry - Asst. Director (Legal) | From 20/10/2025 to 21/11/2025 | Incidental Allowance – USD 1125<br>Warm clothing allowance - Pound 150 |
| 3 | Doha Qatar | Eleventh session of the confrrence of the parties to the United Nations Convention against Corruption | Mr. Chethiya Goonasekara - Commissioner - III<br>Mrs. L.K.T.D. Dayarathna - Asst. Director General | 15/12/2025 to 19/12/2025 | Air tickets - Rs. 458,000/-<br>Incidental Allowance – USD 480<br>Combined Allowance – USD 2562<br>Insurance - Rs. 9,096/- |
| 4 | New York | Second Global conference on harnessing data to improve corruption measurement | Mrs. K.H.I.S.Siriwardana - Deputy Director General | 02/12/2025-04/12/2025 | Air tickets - Rs. 426,000/-<br>Incidental Allowance – USD 240<br>Combined Allowance – USD 2226<br>Insurance - Rs. 4,108/45 |

## 6.3 2025.12.31 දින වන විට මූල්‍ය ප්‍රගතිය

Expenditure Report as at 31/12/2025

| Expenditure Subject No. | Finance Code | Category/Object/Item Description | Budgetary Allocation 2025 | Expenditure as at 31.12.2025 |
|---|---|---|---|---|
| 010-1-1-0-1001 | 11 | Salaries and Wages | 296,180,000.00 | 293,449,179.30 |
| 010-1-1-0-1001 | 21 | Salaries and Wages | 16,800,000.00 | 16,800,000.00 |
| 010-1-1-0-1002 | 11 | Overtime and Holiday Payments | 12,470,000.00 | 12,379,196.25 |
| 010-1-1-0-1003 | 11 | Other Allowances | 355,000,000.00 | 350,482,091.58 |
| 010-1-1-0-1101 | 11 | Travelling Expenses - Domestic | 6,125,000.00 | 6,105,537.79 |
| 010-1-1-0-1102 | 11 | Travelling Expenses - Foreign | 40,000,000.00 | 12,509,498.39 |
| 010-1-1-0-1201 | 11 | Stationary and Office Requisites | 24,100,000.00 | 24,089,314.42 |
| 010-1-1-0-1202(002) | 11 | Fuel Allowance | 12,500,000.00 | 10,340,508.83 |
| 010-1-1-0-1202(009) | 11 | Fuel for Pool Vehicles | 20,400,000.00 | 14,197,906.53 |
| 010-1-1-0-1202(010) | 11 | Fuel for Other Purposes | 100,000.00 | 0.00 |
| 010-1-1-0-1203(002) | 11 | Uniforms | 220,000.00 | 164,000.00 |
| 010-1-1-0-1301 | 11 | Vehicles | 25,000,000.00 | 20,650,794.66 |
| 010-1-1-0-1302 | 11 | Plant and Machinery | 6,410,000.00 | 4,437,511.49 |
| 010-1-1-0-1303 | 11 | Building and Stuctures | 12,300,000.00 | 463,678.20 |
| 010-1-1-0-1304 | 11 | Software Maintenance | 2,000,000.00 | 1,243,408.00 |
| 010-1-1-0-1401 | 11 | Transport | 2,100,000.00 | 950,000.00 |
| 010-1-1-0-1402 | 11 | Postal and Communication | 8,365,000.00 | 8,362,480.92 |
| 010-1-1-0-1403 | 11 | Electricity and Water | 36,000,000.00 | 32,069,880.95 |
| 010-1-1-0-1404 | 11 | Rent and Local Taxes | 1,920,000.00 | 1,856,055.59 |
| 010-1-1-0-1405 | 11 | Cleaning and Janitorial Services | 15,100,000.00 | 14,899,638.58 |
| 010-1-1-0-1407 | 11 | Security Services | 6,100,000.00 | 6,062,810.00 |
| 010-1-1-0-1408 | 11 | Lease Rental for Vehicles procured Under Operatonal Leasing Other | 44,600,000.00 | 43,451,879.04 |
| 010-1-1-0-1409(138) | 11 | Machinery and Office Equipment Service Agreements | 10,000,000.00 | 2,963,612.56 |
| 010-1-1-0-1409(139) | 11 | Vehicle Insurance | 2,000,000.00 | 1,154,528.67 |
| 010-1-1-0-1409(140) | 11 | Miscellaneous Services Expenditure | 4,380,000.00 | 4,373,787.16 |
| 010-1-1-0-1505 | 11 | Subscriptions and Contributions Fee | 1,430,000.00 | 0.00 |
| 010-1-1-0-1506 | 11 | Property Loan Interest to Public Servants | 900,000.00 | 729,282.24 |
| 010-1-1-0-2001 | 11 | Buildings and Stuctures | 40,000,000.00 | 35,067,983.98 |
| 010-1-1-0-2003 | 11 | Vehicles | 1,000,000.00 | 861,400.00 |
| 010-1-1-0-2102 | 11 | Plant, Machinery and Equipment | 15,000,000.00 | 6,423,393.83 |
| 010-1-1-0-2103 | 11 | Furniture and Office Equipment | 50,000,000.00 | 46,269,241.56 |
| 010-1-1-0-2401 | 11 | Staff Training | 5,000,000.00 | 4,543,729.62 |
| 010-1-1-3-2509 | 11 | Bribery and Corruption Awarenees Programme for the Public (Other) | 30,000,000.00 | 7,338,413.18 |
| 010-1-1-5-2509 | 11 | Facilitation of implementing Anti-Corruption Act | 270,500,000.00 | 4,302,699.35 |
| Total | | | 1,374,000,000.00 | 988,993,442.67 |

## 6.4 2025.12.31 දිනට සාරාංශගත මූල්‍ය ප්‍රගතිය

| | අයවැය ප්‍රතිපාදනය - 2025 | 2025.12.31 දිනට වියදම |
|---|---|---|
| පුනරාවර්තන වියදම | 962,500,000.00 | 884,186,581.15 |
| ප්‍රාග්ධන වියදම | 411,500,000.00 | 104,806,861.52 |
| **එකතුව** | 1,374,000,000.00 | 988,993,442.67 |

## 6.5 කාර්ය මණ්ඩල විස්තර

**2025.12.31 දිනට සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු**

| | අනුමත සේවක සංඛ්‍යාව** | අනුයුක්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 63 | 38 |
| තෘතීයික | 218 | 6 |
| ද්විතීයික | 242 | 105 |
| ප්‍රාථමික | 126 | 76 |
| **එකතුව** | **649** | **225** |
| ශ්‍රී ලංකා පොලීසිය විසින් කොමිෂන් සභාවට අනුයුක්තව සේවය කරන විමර්ශන නිළධාරීන් | 283 | 250 |
| මුළු එකතුව | **932** | **475** |

** 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය බවට සලකනු ලබන 971 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් තීරණය කර ඇත. නමුත් දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිව ප්‍රකාරව එම කාර්යමණ්ඩලයට හිමි පාරිශ්‍රමික හා සේවා කොන්දේසි මෙතෙක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කර නොතිබීම හේතුවෙන් දැනට අනුයුක්ත සේවක සංඛ්‍යාවන් මීට පෙර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාවන්ට යටත්ව දක්වා ඇත.